**යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2017**

-----------------------------------------------

වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාලයේ යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ("විද්‍යායතනය") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය හා 2014 ඔක්තෝබර් 03 දිනැති අංක 1882/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නිවේදනයේ 17(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාල පනතේ 49(1) වගන්තිය ප්‍රකාර විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

## 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

## 2.1 මතය ව්‍යාවනය

-------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩුව විගණනයේදී නිරීක්ෂණය විය.

2015 වර්ෂය තුළදී කුසලතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය විසින් රු.මිලියන 112 ක වටිනාකමට ඉදිකර විද්‍යායතනය විසින් උපයෝජනය කරමින් පවතින ගොඩනැගිල්ල විධිමත් ලෙස භාරගැනීමෙන් පසුව 2018 ජුනි 30 වන විටත් ගිණුම් වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ගොඩනැගිලි හා ව්‍යුහයන්වල වටිනාකම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, පසුගිය වර්ෂ 3 ක් සඳහා මෙම ගොඩනැගිල්ල වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදනය ද කර නොතිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය තුළදී ගෙවීම් කරන ලද එකතුව රු.66,618,634 ක් වූ වැටුප් හා වෙනත් දීමනා, මිලදී ගැනීම් හා වෙනත් වියදම්, අනුමැතීන් හා ගෙවීම් සඳහා සහතික කිරීම්, මුල් බිල්පත්‍ර, ඉල්ලීම් භාණ්ඩ ඇණවුම්, භාණ්ඩ ලැබීම් පත්‍ර, සනාථ කිරීම් හා නිර්දේශ කිරීම් ආදී සාක්ෂි නොමැති වීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 12 දරන මුද්දර බදු පනත (විශේෂ විධිවිධාන) | පනතේ දක්වා ඇති පරිදි රු.25,000 ඉක්මවන ගෙවීම්වලින් අයකළ යුතු මුද්දර ගාස්තු අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 136 (6) | බලයලත් පුද්ගලයන්ගේ වාර්තා අවම වශයෙන් මාසයකට වරක් සහතික කිරීමේ නිලධාරීගේ ඒවා සමඟ සැසඳීම කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 267 | රීතියක් වශයෙන් සේවකයෙකුගේ වැටුප් හෝ වේතන ආදායකයාට ගෙවා එය බාරගත් බවට ඔහුගේ අත්සන අදාළ වැටුප් පත්‍රිකාවේ තබවා ගත යුතුය. කෙසේ වුවද, රු.455,631 ක් වූ සේවක වැටුප් ගෙවීම්වලට අදාළව ආදායකයාගේ අත්සන එම අවශ්‍යතාවය පරිදි ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 785 (4) හා 802 | වාහනවලට අදාළව අලුත්වැඩියාවේ ස්වභාවය, අලුත්වැඩියා සඳහා දරන ලද වියදම සහ වෙනත් අදාළ තොරතුරු වාහන ලොග් පොත්වල සටහන් කර නොතිබුණි. |
| (ඇ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විද්‍යායතනයේ වත්කම් පිළිබඳ පැවැත්ම තහවුරු කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩල පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විද්‍යායතනයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.6,677,760 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,953,025 ක් විය. රු.6,415,230 කින් සේවක පිරිවැය වැඩිවීම හා රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.3,402,337 කින් අඩුවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ මෙම ඌනතාවය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සේවක පිරිවැය, ක්ෂය හා බදු සැලකිල්ලට ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ විද්‍යායතනයේ අගය එකතු කිරීම රු.75,303,062 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ රු.75,266,113 ක් විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා මුළු මෙහෙයුම් වියදම රු.90,939,647 ක් වුවද දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය රු.46,105,903 ක් විය. එය සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදමින් සියයට 51 කින් නියෝජනය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 සැලසුම් කිරීම හා කාර්යසාධනය

ඉදිරි වර්ෂ 03 ක් සඳහා විද්‍යායතනයේ වාර්ෂික ඉලක්කයන් හඳුනාගැනීම සඳහා විද්‍යායතනය විසින් සංයුක්ත සැලැස්මක්/ ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්ම/ ව්‍යාපාර සැලැස්මට අනුකූලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට විද්‍යායතනය අපොහොසත් වී තිබුණි. එබැවින්, විද්‍යායතනයේ කාර්යසාධනය විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.

වෙනත් විශ්වවිද්‍යාල විද්‍යායතන මඟින් චාරිකා හා සංචාරක කළමනාකරණය, සිද්ධි කළමනාකරණය, කෘෂිකර්ම හා ජලජ සම්පත් කළමනාකරණය, පසු-අස්වනු තාක්ෂණය හා සන්නිවේදනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව යනාදී බොහෝ පාඨමාලා පවත්වනු ලබන නමුත් යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනය මඟින් එවැනි පාඨමාලා පවත්වා නොතිබුණි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විනිවිදභාවයෙන් බඳවාගැනීම් පරිපාටිය අනුගමනය කිරීම මඟින් බාහිර කථිකාචාර්යවරු තෝරා ගත යුතු බවට තරුණ කටයුතු හා කුසලතා සංවර්ධන අමාත්‍යාංශය විසින් විද්‍යායතනයට උපදෙස් දී තිබුණි. කෙසේ වුවද, පුවත්පත්වල දැන්වීම් පළකිරීමෙන් හෝ වෙනත් කිසියම් මාධ්‍යයක් මඟින් ප්‍රසිද්ධ කිරීමෙන් තොරව සම්මුඛ පරීක්ෂණ මඟින් බාහිර කථිකාචාර්යවරු බඳවාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, අධ්‍යයන පාඨමාලා පැවැත්වීම සඳහා සුදුසු දක්ෂ කථිකාචාර්යවරුන් තෝරාගැනීම සඳහා අවස්ථාව විද්‍යායතනයට අහිමි වී තිබුණි.

(ආ) පත්වීම් ලිපිවල කොන්දේසිවලට අනුව, ඔවුන්ගේ දේශන පැය හා ප්‍රායෝගික පැය බාහිර කථිකාචාර්යවරුන් විසින් සම්පූර්ණ කර නොතිබුණි. එබැවින්, අධ්‍යයන නිර්දේශය බාහිර කථිකාචාර්යවරු විසින් සම්පූර්ණ වශයෙන් ආවරණය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කාර්යක්ෂමව අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට විද්‍යායතනයේ කළමනාකාරීත්වයට නොහැකි වී තිබුණි.

(ඇ) බාහිර කථිකාචාර්යවරුන් සඳහා පැමිණීමේ ලේඛනය විධිමත් ලෙස පවත්වා නොතිබුණු අතර පැමිණීමේ ලේඛනයේ වෙනස් කිරීම්ද සිදුකර තිබුණි.

## 4.3 මෝටර් වාහන උපයෝජනය

වෙන්කරන ලද වාහනයක් වෙනුවෙන් සුපර් ඩීසල් මිලදී ගැනීම සඳහා අනුමැතිය අදාළ බලධාරීන්ගෙන් ලබාගෙන නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

2030 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ජාතික න්‍යාය පත්‍රය පිළිබඳව නොදැනීම හේතුවෙන් අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීම සම්බන්ධයෙන් සංවර්ධනයේ වැදගත් අවස්ථා සහිතව විද්‍යායතනයේ කාර්යයන් පිළිබඳව තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 6.1 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත නොකිරීම හේතුවෙන් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතා කිහිපයක් නිරීක්ෂණය විය.

## 6.2 විගණන කමිටු රැස්වීම

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන මුදල් චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 6.3 ප්‍රසම්පාදන පරිපාටිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 6.3.3 (ආ) අනුව, ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කළ යුතුය. කෙසේ වුවද, ලංසු විවෘත කිරීමේ කමිටුවේ අනිකුත් සාමාජිකයන් හා අදාළ ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ සහභාගීත්වය නොමැතිව මූලාධිකාරී විසින් රු.16,134,232 ක් වටිනා ලංසු 24 ක් විවෘත කර තිබුණි.

(ආ) පුස්තකාලය සඳහා කවුන්ටර්, බිම් දසුන් සැකසීමේ වැඩ, ලී බඩු, විද්‍යුත් පුහුණු පද්ධති, ඇලුමිනියම් පාටිෂන් වැඩ, ඩිජිටල් මල්ටි මීටර්, DC පවර් සප්ලයි හා CCTV වයර් ප්‍රසම්පාදනය සඳහා රු.4,213,156 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.3.2 ප්‍රකාරව ඉහත ප්‍රසම්පාදනයන් සඳහා ඉදිරිපත් කරන ලද ලංසුවල ලංසුකරුවන් විසින් ඉදිරිපත් කළ යුතු නියමිත හා අදාළ මූලික තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

## 6.4 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6.5 වාර්ෂික වාර්තාව සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව, 2015 හා 2016 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2017 මැයි 31 දක්වාත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 7 පද්ධති හා පාලන

පද්ධති හා පාලනවල නිරීක්ෂණය වූ අඩුපාඩු විද්‍යායතනයේ ප්‍රධාන විධායක නිලධාරීගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගබඩා පරිපාලනය | ගබඩා විෂයයන් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) ගිණුම්කරණය | අදාළ ලෙජර හා වැය සංකේත භාවිතා කර නොතිබුණි. |
| (ඇ) ගෙවීම් පිළිබඳ පාලනය | ගෙවීම් වවුචර් සඳහා අනුමැතීන් හා සහතික කිරීම් ලබාගෙන නොතිබුණි. |